# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2023 -02 - 08

පැමිණිලි පාර්ශවය : එස්.එම්.පී.ඒ.සජීවනී මිය,
අංක. 71/133, හේවාහැට පාර,
තල්වත්ත, මහනුවර.

වගඋත්තර පාර්ශවය : 01. ග්‍රාම නිලධාරිනි,
221 වසම, තල්වත්ත.

02. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, මහනුවර.

03. විදුහල්පති,
මහ/ධර්මරාජ විදුහල, මහනුවර.

04. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/K/04/20/W</u>

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා අංක 71/133 දරණ ලිපිනයේ උපන්දා සිටම ස්ථිර පදිංචිකරුවකු ලෙස සිටින බවත්, 1998 සිට තමාගේ ඡන්දය තල්වත්ත 221 ඌව සෙංකඩගල ඡන්ද බල ප්‍රදේශයට ලියාපදිංචි වී තිබූ බවත්, තම ස්වාමිපුරුෂයාගේ ඡන්ද ලියාපදිංචිය 2013 වර්ෂයේ සිට මෙම නිවසට ලියාපදිංචිව ඇති බවත්, 2017 මැද භාගයේදී පමණ තල්වත්ත 221 ග්‍රාමනිලධාරි මහතා ඉවත් වී පත්වූ නව ග්‍රාමනිලධාරිනිය විසින් තමාගේ හා තම ස්වාමිපුරුෂයාගේ නම් ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ බවත්ය. තමාගේම අත්අකුරින් ලියාදුන් එම ලේඛනය ඉවත් කර ඇති බව දැනගත් පසු ඒ පිළිබඳව අදාළ ග්‍රාම නිලධාරිනියගෙන් විමසීමේදී තමා නිවසේ නොසිටි නිසා ඡන්ද හිමි නාමලේඛනයෙන් නම ඉවත් කළ බව පැවසූ බවත්, තමා හා ස්වාමිපුරුෂයා රැකියාවන්වල යෙදෙන බැවින් දරුවන් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක රඳවා රාජකාරියට යන බවත්, එසේ හෙයින් දිවා කාලයේ නිවසේ රැඳීමට කාලයක් නොමැති බවත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman — 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone — 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary — 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

එසේම තමාගේ වැඩිමහල් දරුවා වන එච්.එම්. දමිතු සෙහස් බණ්ඩාර යන අය 2020 පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට අදාළව මහනුවර ධර්මරාජ විද්‍යාලයට අයදුම්පත් යොමු කළ බවත්, එකී සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 83 ක් තමාට හිමිවූ බවත්, පාසලට ඇතුළත් කරගන්නා කඩඉම් ලකුණු ප්‍රමාණය 85 ක් වූ නමුත්, නමුත් තමාගේ හා ස්වාමියාගේ නම් 2018 ඡන්ද නාමලේඛනයෙන් ඉවත් කර තිබූ හෙයින් එයට ලබාදෙන ලකුණු 5ක් තමාගේ දරුවාට අහිමි වූ බවත්, එසේ ඡන්ද නාමලේඛනයෙන් නම ඉවත් කර නොතිබුනේ නම් තමාගේ දරුවාට ලකුණු 88ක් හිමිවන බවත් වැඩිදුරටත් දක්වා ඇත. මේ හේතුවෙන් මහනුවර ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් වීමට තිබූ අවස්ථාව තම දරුවාට අහිමි වූ බවත්, මෙම ගැටළුව තමාගේ දරුවන් තිදෙනාටම බලපාන කරුණක් බවත්, එබැවින් මේ පිළිබඳව සොයා බලා තම දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීමට කටයුතු සිදුකරදෙන ලෙස ඉල්ලා සිටින බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-**

පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවීය නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් විසින් කොමිසම වෙත වාර්තාවක් යොමු කරමින් දක්වා ඇත්තේ, සුහසිංහ මද්දුමගේ පද්මිණී අමරා සංජීවනී ඇතුළුව සිව්දෙනෙකුගේ නම් 221-තල්වත්ත වසමේ ග්‍රාම නිලධාරි විසින් 2018 ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනයේදී ඉවත් කර ඇත්තේ, මෙම අයගේ පදිංචිය සනාථ නොවීම මතවන බවයි.

ඉවත් කරන ලද නම් සඳහා අභියාචනා කැඳවීම් සිදුකරන ලද අතර, පරීක්ෂණ මඟින් අදාළ නම් ප්‍රතිශෝධන කාලසීමාවේ දී ඔවුන්ගේ සාමාන්‍ය පදිංචිය තහවුරු වන ස්ථානය ලියාපදිංචියට කටයුතු කරන බවත්, ඊට සමගාමීව ප්‍රදර්ශනය කරන ලද දැනුම්දීම්වලදී අභියාචනා අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් මෙම පැමිණිලි පාර්ශවය විසින් අදාළ කාල සීමාවේදී සිදුකර නොමැති බවත්, එම හේතුවෙන් ඉදිරි කටයුතු සිදුකිරීමට පනතේ විධි විධාන ප්‍රකාරව අවස්ථාවක් නොමැති බවත්ය.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වී ඇති කරුණු :-**

කොමිසම වෙත කරන ලද පැමිණිල්ල ප්‍රකාරව පැමිණිලිකාර එස්.එම්.පී.ඒ.සංජීවනී මහත්මියගේ වැඩිමහල් දරුවා වන එච්.එම්.දමිත සෙහස් බණ්ඩාර යන අය 2020 මහ/ධර්මරාජ විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් යොමු කර ඇති අතර, ඒ සඳහා R-184 යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමෙන් ලකුණු 83ක් හිමිකරගෙන ඇත.

පාසලට ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් ලැබීය යුතු ලකුණු ප්‍රමාණය ලකුණු 85කි. එනමුත් 2018 වසර සඳහා ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුළත්ව නොතිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් ලැබෙන ලකුණු 05ක ප්‍රමාණය පැමිණිලි පාර්ශවයට අහිමි වීමෙන් මෙම දරුවාට මහ/ධර්මරාජ විද්‍යාලයට ඇතුළත්වීමේ අවස්ථාව අහිමි වී ඇත.

මේ පිළිබඳව වගඋත්තරකාර පාර්ශවයෙන් කරනු ලැබූ ලිඛිත විමසීමේදී, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්ගේ අංක KE/R/H/2021/05 හා 2021.03.12 දිනැති ලිපිය කොමිසම වෙත යොමු කරමින් දන්වා ඇත්තේ, පැමිණිලි පාර්ශවයේ පදිංචිය සනාථ නොවීම හේතුවෙන් 2018 ඡන්දහිමි නාමලේඛනයේ නම් ඇතුළත්ව නොමැති බවත්,

ඉවත්කළ නම් සඳහා අභියාචනා කැඳවීම් සිදුකලද අභියාචනා අයදුම්පත්‍ර සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවයෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැති බවත් දක්වා ඇත.

ඒ අනුව මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් 2021.03.30 දින පවත්වන ලද මූලික පරීක්ෂණ කටයුතුවලදී වගඋත්තර පාර්ශවය අදාළ ග්‍රාම නිලධාරිනිය ප්‍රකාශ කරනු ලැබුයේ, තමා 221 ග්‍රාම නිලධාරි වසමට අළුතින් පත්ව ආ බවත්, මොවුන්ගේ පදිංචිය පිළිබඳ සොයා බැලීමේදී නිවසේ නොසිටි නිසා ඡන්ද හිමි නාමලේඛනයෙන් නම ඉවත් කිරිමට කටයුතු කළ බවත්ය.

එසේම ග්‍රාම නිලධාරිගේ කරුණු වාර්තා කිරිමෙන් අනතුරුව ඉවත් වූ නම් සඳහා අභියාචනා කැඳවීම සිදුකර පරීක්ෂණ මඟින් අදාළ නම් ප්‍රතිශෝධන කාලසීමාවේදී සාමාන්‍ය පදිංචිය තහවුරු වන ස්ථානයක ලියාපදිංචියට කටයුතු සිදුකරනු ලබන බවත් ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධව සාමාන්‍ය තැපැලෙන් අදාළ ලිපියොමු කර ඇති බවත්, පැමිණිලි පාර්ශවයෙන් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොලද බවත්, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නියෝජනය කරමින් පැමිණි පරිපාලන නිලධාරිනි ඩබ්.සී.කේ.සිල්වා මහත්මිය ප්‍රකාශ කර ඇත.

පැමිණිලි පාර්ශවය දන්වා සිටින පරිදි එවකට මේ සම්බන්ධයෙන් කිසිදු ලිපියක් ලැබී නොමැති බවත්, කිසිදු දැනුම්දීමක් කර නොමැති බවත්, තමා වෙනත් කිසිදු ස්ථානයකට පදිංචියට නොගිය බවත්, ඡන්දය වෙනත් කිසිදු ස්ථානයක ලියාපදිංචි කර නොමැති බවත්ය.

එසේම 2017 වසර හැර 1998 වසර සිට මේ දක්වා තම ඡන්දහිමි නාමලේඛනයේ නම සඳහන්ව ඇති අතර, සනාථ කරගැනීමෙන් අනතුරුව මහ/ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති වෙත කොමිෂන් සභාව විසින් 2022.02.07 දිනැති ලිපියට ප්‍රතිචාර ලෙස එම විද්‍යාලය මගින් කරුණු සොයා බලා පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුව ඇති බවට සනාථ කරමින් මෙම දරුවා පාසලට ඇතුළත් කර ගැනීම සඳහා උපදෙස් පතා කොමිසම වෙතද පිටපත් සහිතව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත 2022.08.04 දිනැති ලිපියක් යොමු කර ඇත.

එයට පිළිතුරු වශයෙන් ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/1/6/12/HRC/2021-44 හා 2022.09.28 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත යොමු කරමින් එම දරුවා මහ/ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් කරගැනීමට අදාළ කොමිෂන් සභාවේ විධිමත් නිර්දේශයක් ලබාදෙන ලෙස දැනුම් දී ඇත.

**නිගමනය :-**

මෙම පැමිණිලිකාර එස්.එම්.පී.ඒ.සංජීවනි මහත්මියගේ දරුවා වන එච්.එම්.දමිත සෙහස් බණ්ඩාර දරුවා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ 2020 පළමු වසරට ඇතුළත් කිරීම සඳහා යොමු කළ අයදුම්පත්‍රය අනුව 2017 වසරේ ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුළත් නොවීම මත අහිමි වූ ලකුණු 05 හේතුවෙන් එම පාසලට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී ඇත.

රාජ්‍ය නිලධාරින් ලෙස අදාළ වසමේ ග්‍රාම නිලධාරිනි හා මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ නිලධාරින් නිසි සොයා බැලීමකින් තොරව විනිවිද භාවයකින් තොරව කටයුතු කිරිම හේතුවෙන් මෙම දරුවාට ආසන්නතම

පාසල වන මහ/ධර්මරාජ විද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1 වන හා 2 වන වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලි පාර්ශවයට හිමිවිය යුතු ලකුණු අහිමි වී ඇති බවට නිරීක්ෂණය වන බැවින්, අදාළ අයදුම්පත නැවත සලකා බලා පැමිණිලිකරුට හිමිවිය යුතුව තිබූ ලකුණු නැවත ගණනය කිරීමෙන් පසුව, ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුළත් වීමට සුදුසුකම් ලබන්නේ නම් එච්.එම්.දමිත සෙහස් බණ්ඩාර දරුවා මහ/ධර්මරාජ විද්‍යාලයේ 2023 වර්ෂයේ 04 ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 03 . 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

04. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/